00605

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධි වැඩසටහන

3 වන මට්ටම 2022/2023 - අවසාන පරීක්ෂණය

ළමා සංවර්ධනය - EPU3530

කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2024.02.03 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 01- කොටස

01. පවතින නිර්වචන දෙකක් (02) ආධාරයෙන් ළමා සංවර්ධනය යන සංකල්පය ඔබේ වචනයෙන් පැහැදිලි කරන්න.

02. පූර්ව ප්‍රසව සංවර්ධනයට බලපාන සාධක හයක් (06) ලියන්න. සාධක දෙකක හිතකර බලපෑම පැහැදිලි කරන්න.

03. "ළමයෙකුගේ පරිනත බව ඉගෙනීම කෙරෙහි බලපානු ලබයි" කරුණු ඉදිරිපත් කරමින් එම අදහස තහවුරු කරන්න.

04. "සමාග්‍රහණය හා ප්‍රතියෝජනය" යන සංකල්ප හඳුන්වා දෙන්න.

05. ඉඩ් සංස්කාරය, අහංභාවය සහ උපරි අහංභාවය යන සංකල්ප පැහැදිලි කරන්න.

06. පූර්ණ බලාධිපත්‍ය පවුලක ජීවත්වන දරුවෙකු තුළින් ප්‍රදර්ශනය වන ලක්ෂණ පහක් (05) ලියන්න.

07. දරුවන්ගේ පෞරුෂ සංවර්ධනය සඳහා දෙමාපියන්ට සහාය විය හැකි ආකාර දහයක් (10) ලියන්න.

08. ගුරුවරයෙකු විසින් සිසුන්ගේ ගැටලුකාරී හැසිරීම් පාලනයට යොදා ගත හැකි උපක්‍රම පහක් ලියන්න.

(ලකුණු5X 8=40)

## 02-කොටස

09\. i. "ආරය සහ පරිසරය ළමා සංවර්ධනය කෙරෙහි බලපාන ප්‍රධාන සාධක 2කි." මෙම සාධක දෙකෙහි බලපෑම තර්කානුකූල ව විමසන්න. (ලකුණු 10)

ii. ළමා සංවර්ධන ක්ෂේත්‍ර පිළිබඳ ව ප්‍රාථමික පාසල් ගුරුවරුන් නිවැරදි අවබෝධයක් ලබා ගැනීමේ වැදගත්කම් පහක් (05) උදාහරණ ඉදිරිපත් කරමින් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

10\. i. "දරුවෙකුගේ ඉගෙනුමට සූදානම පිළිබඳව පළපුරුදු ගුරුවරයා හඳුනාගනී" ඉගෙනුමට සූදානම පිළිබඳ දැනුම ගුරුවරයෙකුට වැදගත්වන ආකාරය ඔබගේ අත්දැකීම් ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

ii. ළමයින් පහත දැක්වෙන විවිධ ආකාරයන්ට ඉගෙනුම් ක්‍රියාවලියේ යෙදෙයි.

- නිරීක්ෂණය.
- අනුකරණය.
- සෙල්ලම් හා ගවේශනය.

ඉහත දක්වන ඉගෙනුම් ආකාර පාඩමක් තුළ සිසුන් විසින් යොදා ගතහැකි වන අන්දමට ඔබ කිසියම් පාඩමක් (ප්‍රාථමික ශ්‍රේණි ආශ්‍රිත) සැලසුම් කරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

11\. i. මොළයේ සංවර්ධනය පිළිබඳ නූතන පර්යේෂණ අනාවරණ විස්තර කර මොළයේ සංවර්ධනය සඳහා පූර්ව ප්‍රසව පරිසරය දායකවන ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 10)

ii. ප්‍රාථමික පාසල් ගුරුවරයෙකු ලෙස ඔබ දරුවෙකුගේ මොළයේ වර්ධනයට බලපාන සාධක පිළිබඳ ව දැනුවත්ව සිටීමේ වැදගත්කම උදාහරණ ගෙනහැර දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

12\. i. පෙර පාසල් වයසේ දරුවන්ගේ ප්‍රජානන සංවර්ධනයේ ලක්ෂණ හතරක් පැහැදිලි කර එම තත්ත්වයන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට ගළපා ගත යුතු ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 10)

ii. ප්‍රජානන සංවර්ධන පිළිබඳ ව විගොට්ස්කි සහ පියාජේ ඉදිරිපත් කළ අදහස් ළමයින්ගේ ප්‍රජානන සංවර්ධනය සුසාධ්‍යකරණය සඳහා ගුරුවරයෙකු ලෙස ඔබ භාවිත කරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

13. i. දරුවන්ගේ සාමාජයීය හා චිත්තවේග සංවර්ධනය සඳහා පහත සඳහන් කරුණු බලපාන ආකාරය පිළිබඳ ව ඔබගේ අදහස් ඉදිරිපත් කරන්න.

- ආදරය හා සෙනෙහස
- සුරක්ෂිත බව හා ස්ථාවර බව
- සමාජානුයෝගී වීම සඳහා අවස්ථා

(ලකුණු 10)

ii විත්තවේගීය ගැටුලු සහගත තත්ත්වයකට මුහුණ දි සිටින දරුවෙකු එම තත්ත්වයෙන් මුදවා ගැනිම සඳහා සාර්ථක ගුරුවරයෙකු ලෙස ඔබ භාවිත කරන උපායමාර්ග ලියා දක්වන්න. (ලකුණු 10)

**********************************************************************